


11නුමුත් ඔහු ඔවුන්ට උත්තරදෙමින්: මා සුවකළ තැනැත්තේම–
නුඹේ යහන රැගෙන යන්නැයි මට කීසේකැයි කීවේය. 12නුඹේ
යහන රැගෙන යන්නැයි නුඹට කී මනුෂ්‍යයා කවුදැයි ඔව්හු
ඔහුගෙන් ඇසුවෝය.

**(යොහාන් 5: 11-12)**

## Stations of the cross (basement) කුරුසයේ පාමුල - ස්ථානය (පහත මාලය)

පහත මාලයේ ඇති නැවතුම් පොළ සඳහා, මහා සිකුරාදා සිදුවීම් හරහා යේසුස් වහන්සේගේ කුරුසියට යන ගමන අනුගමනය කරමු. මෙම අත්දැකීම තුළින්, අපි අපගේම ජීවිතය සහ අපගේ පෞද්ගලික බිඳවැටීම් ගැන යේසුස් වහන්සේගේ ආදර්ශයේ ආලෝකයෙන් මෙනෙහි කරමු. අප වෙනුවෙන් කුරුසිය මත උන් වහන්සේගේ පරිත්‍යාගයේ තරම ද අපි සොයා ගනිමු.

There are 6 stations in total - **මුළු ස්ථාන ගණන 6 කි.**

1) **පාද සේදීම**

**2) ජේසුස් වහන්සේ හෙළා දැකීම**

**3) ජේසුස් වහන්සේ ඔහුගේ කුරුසිය පිළිගැනීම**

**4) සීමොන් කුරුසය රැගෙන යෑම**

**5) ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසීම**

**6) ජේසුස් වහන්සේ කුරුසියේ මිය යෑම**

## Format for Stations of Cross - කුරුසයේ පාමුල නැවතුම් පොළ සඳහා ආකෘතිය.

**සෑම ස්ථානයක්ම කොටස් 4 කට බෙදා ඇත. පොත් පිංච (ඊ-පිටපත හෝ සන පිටපත) තුලින්, එක් එක් කොටස සඳහා ගත යුතු පියවර ආනාවරණය කර ඇත. එය සෙමින්, භාවනාවෙන් කියවීමට වග බලා ගන්න.**

**1) ශුද්ධ ලියවිල්ලේ පරිච්ඡේදය**

**මෙම ඡේදය "කුරුසයේ පාමුල" ආනාවරණය වන සිද්ධිය විස්තර කරයි.**

**2) පුද්ගලික කියවීම**

**ඔබේ හදවතේ මෙනෙහි කිරීමේ ඉරියව්වකට ඇතුළු වීමට මෙය මෘදු හඬින් කියවන්න.**

**3) පුද්ගලික ආවර්ජනය සහ ක්‍රියාකාරකම්**

**දී ඇති පියවර අනුගමනය කිරීමෙන්, යේසුස් වහන්සේගේ ක්‍රියාවේ ආලෝකයෙන් ඔබේම ජීවිතය ගැන මෙනෙහි කරන්න. (මෙය සඳහා කෙටි**

බයිබල් පදයක් සපයා තිබිය හැක). මෙම කොටස සඳහා ඔබට අවශ්‍ය කාලය ගන්න, එවිට ඔබට දෙවියන් වහන්සේගේ වචනය ගැඹුරින් අදාල කරගැනීමට පුළුවන් වනු ඇත.

4) ප්‍රතිචාරාත්මක යාච්ඤාව

මෙම යාච්ඤාව කියවීමෙන් හෝ ඔබේම යාච්ඤාවක් කරීමෙන්, මෙම නැවතුම් පොළ අවසාන කරන්න.


## Station 1: Foot washing – 1 වන ස්ථානය: පාද සේදීම

### Scripture Passage - ශුද්ධ ලියවිලි පාඨය (යොහන් 13:3-5, 12-17)

3රාත්‍රිකෑම කද්දී, උන්වහන්සේ පියාණන්වහන්සේ විසින් තමන්ගේ අත්වලට සියල්ල දී තිබෙන බවද තමන් දෙවියන්වහන්සේ වෙතින් ආ බවද දෙවියන්වහන්සේ ළඟට යන බවද දැන, 4රාත්‍රිකෑමෙන් නැගිට, උඩ ඇඳුම ගළවා තබා, රෙදිකඩක් රැගෙන ඉඟටියෙහි බැඳගත්සේක. 5ඉන්පසු උන්වහන්සේ භාජනයට වතුර වත්කොට ගෝලයන්ගේ පාද සෝදන්ටත් තමන් ඉඟටියේ බැඳගත් රෙදිකඩින් පිසදමන්ටත් පටන්ගත්සේක.

12මෙසේ උන්වහන්සේ ඔවුන්ගේ පාද සෝදා තමන් ඇඳුම් ඇඳ නැවත හිඳගත්කල ඔවුන්ට කියනසේක්: මා නුඹලාට කළ දේ කිමෙක්දැයි නුඹලා දන්නහුද? 13ආචාරිනි, ස්වාමීනි කියා නුඹලා මට කියහුය. නුඹලා කියනවා හරිය; මක්නිසාද මම එසේ වෙමි. 14ඉදින් ස්වාමිද ආචාර්යද වූ මම නුඹලාගේ පාද සේදීම් නම් නුඹලා විසිනුත් එකිනෙකාගේ පාද සේදිය යුතුය. 15මක්නිසාද මා නුඹලාට කළ ලෙස නුඹලාත් කරන පිණිස නුඹලාට ආදර්ශයක් දුනිමි. 16සැබවක් සැබවක් නුඹලාට කියමි–දාසයෙක් තමාගේ ස්වාමියාට වඩා උතුම් නැත; පණිවුඩකාරයෙක්ද තමා යැවූ තැනැත්තාට වඩා උතුම් නැත. 17ඉදින් මේ දේවල් දන්නාවූ නුඹලා ඒවා කරනවා නම් නුඹලා ආශීර්වාදලද්දෝය.

### Personal Reflection - පුද්ගලික ආවර්ජනය



පියාණන් වන දෙවියන් වහන්සේ සෑම දෙයක්ම යේසුස් වහන්සේගේ බලය යටතට පත් කර ඇති බව යේසුස් වහන්සේ දැන සිටියේය - එම නිසා උන්වහන්සේ තම අනන්‍යතාවයේ සම්පූර්ණයෙන්ම ආරක්ෂිතයි. එය එසේ උනත්, නිවසේ සේවකයෙකුගේ ස්ථානය ලබා ගනිමින් පහළම ස්ථානයට බැස, යේසුස් වහන්සේ තම ගෝලයන්ගේ පාද සේදීය. අනතුරුව යේසුස් වහන්සේ තම ගෝලයන්ට පැවසුවේ උන්වහන්සේව අනුගමනය කිරීමට ගොලයන්ට ආදර්ශයක් ලබා දුන් බවයි. පාද සේදීම පහත්, සාමාන්‍ය, සහ අප්‍රසන්න දෙයක් ලෙස සලකන නිසා, පාද සේදීම, නිහතමානී සේවයේ ජීවන රටාවක් සංකේතවත් කරයි. මෙම ස්ථානයේදී, පල්ලියේ නායකයින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නිහතමානිකම සහ ප්‍රේමය නැවත ප්‍රතිනිර්මාණය කිරීමක් ලෙස, උන්වහන්සේ, පැවසු පරිදි, උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරනු ඇත.

## Station 2: Jesus is condemned – 2 වන ස්ථානය: ජේසුස් වහන්සේ හෙළා දැකීම.

**Scripture Passage - ශුද්ධ ලියවිලි පාඨය (මතෙව් 27:11-14, 24, 26)**

*11යේසුස්වහන්සේ ආණ්ඩුකාරයා ඉදිරියෙහි සිටිසේක. නුඹ යුදෙව්වරුන්ගේ*
*රජදැයි ආණ්ඩුකාරයා උන්වහන්සේගෙන් ඇසුවේය. එසේයයි*
*යේසුස්වහන්සේ කීසේක. 12නායක පූජකයන්ද වැඩිමහල්ලන්ද*
*උන්වහන්සේට වරද තැබූ විට උන්වහන්සේ කිසි උත්තරයක් දුන්නේ*
*නැත. 13එවිට පිලාත් කථාකොට: මොව්හු නුඹට විරුද්ධව කොපමණ*
*කාරණා ගැන සාක්ෂි කියන්නෝද කියා ඇසෙන්නේ නැද්දැයි*
*කීවේය. 14නුමුත් උන්වහන්සේ එක වචනයකටවත් උත්තර නුදුන්සේක.*
*එහෙයින් ආණ්ඩුකාරයා බොහෝසෙයින් මවිතවූයේය. 24මෙසේ*

*කෝලාහලයක් හටගන්නවා මිස තමාගේ උත්සාහයෙන් කිසි පලක් නැති බව පිලාත් දැක, වතුර ගෙන සමූහයා ඉදිරියේ අත් සෝදමින්: මේ ධර්මිෂ්ඨයාගේ ලේ ගැන මම නිදොස්වෙමි. නුඹලාම බලාගන්නැයි කීවේය. 26එකල ඔහු බරබ්බස් ඔවුන්ට නිදහස්කරදුන්නේය. නුමුත් ඔහු යේසුස්වහන්සේට තළවා, උන්වහන්සේ කුරුසියෙහි ඇණගසනු ලබන්ට භාරදුන්නේය.*

## Personal Reading පුද්ගලික කියවීම

**ජේසුනි, ඔබ මට කතා කල මැනවි! ඔබ වහන්සේට එල්ල කල චෝදනා වලට සහ ඔබ වහන්සේව හෙළා දැකීමට පෙර ඔබ වහන්සේ කවුරුන්ද යන්න ප්‍රකාශ කර ඔබේ නිර්දෝෂීභාවය ප්‍රකාශ කරනු ඇතැයි මම සිතුවෙමි. සහ වෙනත් කෙනෙක් හරි ඔබ වහන්සේ වෙනුවෙන් කතා කරනු ඇතයි මම සිතුවෙමි! ඔබ වහන්සේගෙන් සුවය ලැබූ ලාදුරු රෝගීන් කොහෙද, පෙනීම ලැබූ අන්ධයෝ කොහෙද? ඔබ තෝරා ගත් වසර 3ක් ඔබ වහන්සේ පසුපස ගිය ඔබේ ගෝලයන් කොහෙද? මේ අවස්ථාවේදී, ඔබ වහන්සේ වෙනුවෙන් කතා කරන්නට, ඔබ වහන්සේට උපකාර කරන්නට, සමූහයා තුළ කිසිම හඬක් ඔබේ ආරක්ෂාවට පැමිණියේ නැත. ඔබ තනිවම නැගී සිටියහ. "මම තනියම හිටගත්තු අවස්ථා ඇත. මට බොරු චෝදනා එල්ල වූ අවස්ථා ඇත, කිසිවෙක් මා වෙනුවෙන් කතා නොකළ අවස්ථා ඇත. මට අසාධාරණ වූ අවස්ථා සහ මිනිසුන් මා ගැන වැරදි නිගමනවලට එළඹුණු අවස්ථා ඇත. සහ සමහර අවස්ථා වල මම අනිත් අයටත් අසාධාරණයක් කරලා ඇත. සමහර විට මම අන් අය ගැන විනිශ්චය කිරීමට ඉක්මන් වී ඇත. මට විනිශ්චය කිරීම කොතරම් පහසුද, නමුත් විනිශ්චය ලබා ගැනීම මට කොතරම් දුෂ්කරද! ස්වාමීනි, මගේ කුහකකමට මට සමාව දෙන්න, සෑම විටම මා කල යුතු දේ නොකිරීම ගැන මට සමාව දෙන්න.**

## Personal Reflection - පුද්ගලික ආවර්ජනය (1 පේතෘස් 2: 22-23)

*22උන්වහන්සේ කිසි පාපයක් නොකළසේක, උන්වහන්සේගේ මුඛයෙහි වංචාවක්ද සම්බවුණේත් නැත, 23උන්වහන්සේ නින්දාකරනු ලැබූ කල නින්දා නොකළසේක; වධවින්ද කල තර්ජන නොකර, ධර්මිෂ්ඨලෙස විනිශ්චයකරන තැනන්වහන්සේට කාරණය භාරදුන්සේක.*

**හෙළා දකින/චෝදනාවන් දෙස බලන්න. ඔබ ගැන අන් අය කතා කළ සිත් රිදවන වචන මොනවාද? අන් අය ඔබව වැරදි ලෙස විනිශ්චය කර ඇති මාර්ග මොනවාද? ඔබ තවමත් මේ චෝදනා ඔබේ හදවතේ තබාගෙන සිටිනවාද?**

දැන් ඔබේම ප්‍රතිචාරය ආවර්ජනය කරන්න: ඔබ මෙම චෝදනා වලට ප්‍රතිචාර දක්වන්නේ දේවභක්තික ලෙසද නැතහොත් අභක්තික ලෙසද? 1 පේතෘස් 2: 22 - 23 හි ජේසුස් වහන්සේගේ ආදර්ශය සලකා බලන්න. ඔබේ රිදවීම් සහ ඔබේ චිත්තවේගීය තුවාල දෙවියන් වහන්සේට භාර දීමට යම් කාලයක් ගත කරන්න. දෙවියන් වහන්සේ තම කාලය තුළ ඔවුන් වෙනුවෙන් සාධාරණ ලෙස විනිශ්චය කරනු ඇතැයි විශ්වාස කරමින් ඔබ මුහුණ දෙන අසාධාරණ තත්වයන් දෙවියන් වහන්සේට ඉදිරිපත් කිරීමට ද යම් කාලයක් ගත කරන්න.

**Prayer - යාච්ඤාව**

***ජේසුනි, ඔබේ නිශ්ශබ්දතාවය තුළ, ඔබ කවුරුන්ද යන්න පිළිබඳ ඔබේ විශ්වාසය හෙළි කරන නිහඬ ශක්තියක් මම දකිමි. ස්වාමීනි, විවේචනාත්මක හෝ අන් අයව වරදට පත් නොකර, ජීවිතයේ මුහුණ දෙන්නා වූ අසාධාරණයන් සමඟ කටයුතු කිරීමට මට උදව් කල මැනව. ඔබගේ යුක්තිය සහ කාලය කෙරෙහි විශ්වාසය තබා ගැනීමට මට උදව් කරන්න.***

*ආමෙන්*

## Station 3: Jesus Accepts His Cross – 3 වන ස්ථානය: ජේසුස් වහන්සේ ඔහුගේ කුරුසිය පිළිගැනීම.

**Scripture Passage - ශුද්ධ ලියවිලි පාඨය (මතෙව් 27: 26-31)**

***26එකල ඔහු බරබ්බස් ඔවුන්ට නිදහස්කරදුන්නේය. නුමුත් ඔහු යේසුස්වහන්සේට තළවා, උන්වහන්සේ කුරුසියෙහි ඇණගසනු ලබන්ට භාරදුන්නේය. 27එකල ආණ්ඩුකාරයාගේ භේවායෝ යේසුස්වහන්සේ ප්‍රේතෝරියම් ශාලාවට ගෙනගොස් මුළු භේවා කණ්ඩායම උන්වහන්සේ වෙතට රැස්කළෝය. 28ඔව්හු උන්වහන්සේගේ ඇඳුම් ගළවා, රතු සළුවක් උන්වහන්සේට හැඳෙවුවෝය. 29ඔව්හු කටු ඔටුන්නක් ගොතා උන්වහන්සේගේ හිසෙහි තබා, බටදණ්ඩක් දකුණතට දී, උන්වහන්සේ ඉදිරියෙහි දණ නමා: යුදෙව්වරුන්ගේ රජ්ජුරුවෙනි, ශුභසිද්ධවේවයි කියා උන්වහන්සේට කවටකම්කළෝය. 30ඔව්හු උන්වහන්සේට කෙළගසා, බටදණ්ඩ ගෙන උන්වහන්සේගේ හිසට ගැසුවෝය. 31උන්වහන්සේට කවටකම්කළ පසු ඔව්හු රතු සළුව ගළවා උන්වහන්සේගේම ඇඳුම් හඳවා, කුරුසියෙහි ඇණගසන පිණිස ගෙනගියෝය.***

## Personal Reading: පුද්ගලික කියවීම.

ජේසුනි, ඔබගේ කස පහර සහ ඔවුන් ඔබගේ හිස මත තැබූ කටු ඔටුන්න පිළිබඳ වේදනාවෙන් මම කම්පා වෙමි. සොල්දාදුවන් අතින් ඔබ වහන්සේ අත්විඳි නින්දාව සහ පරිහානිය ගැන මම දුක් වෙමි. වේදනාව සහ උපහාසය නොතකා ඔබ වහන්සේ ඔබේ උරහිස් මතට කුරුසය පිළිගන්නවා - ඔබ චෝදනා කරන්නේ නැත, ඔබගේ නිර්දොෂ භාවය පෙන්වීමට විරෝධතාවය පෙන්වන්නේ නැත, අසාධාරණයට ශාප කරන්නේ නැත.

නමුත් ජීවිතයේ බොහෝ දේ ගැන මැසිවිලි නැඟීමට සහ දොස් නඟන්නට මම බොහෝ සෙයින් පෙලඹී සිටිමි. කරදර මට බරක් වන අතර අධික ලෙස දැනේ. මේවා මගේ ජීවිතයේ උසුලන්නා වූ කුරුස වේ. සමහර වෙලාවට, ඇයි මට විතරක් මෙසේ සිදුවන්නේ කියා, මම ගැන මම ආත්ම අනුකම්පාවට වැටෙනවා. සමහර විට මම අන් අය සමඟ සැසඳීමට ඉක්මන් වෙමි, මගේ කුරුසය ඔවුන්ගේ කුරුසයට වඩා විශාල හා බර යැයි උපකල්පනය කරයි.

නමුත් අද දවසේ ඔබ දැරූ කුරුසිය සහ ඔබ පෙන්වා දුන් ආදර්ශය දෙස මම බලමි. ඔබ දරා සිටින බරේ ආලෝකය තුළ, මගේ දුක් වේදනා තුළ මම තනිවම නොවන බව මට වැටහෙනවා. ඔබ වහන්සේගේ ආදර්ශය අනුව, ආත්ම අනුකම්පාව හෝ සැසඳීමට වඩා හොඳ මාර්ගයක් ඇති බව මට වැටහෙනවා. - මම මගේ මුළු හදවතින්ම, දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත් වෙමි.

## Personal Reflection - පුද්ගලික ආවර්ජනය (1 පේතෘස් 2: 19, 21)

***19**මක්නිසාද යමෙක් දෙවියන්වහන්සේ කෙරෙහිවූ හෘදයසාක්ෂිය නිසා අයුතුලෙස පීඩා විඳිමින් දුක් ඉවසන්නේ වී නම්, ඒක ප්‍රශංසනීය දෙයක්ය. **21**එසේය, ඊට නුඹලා කැඳවනු ලැබුවහුය. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධවිඳ, නුඹලා උන්වහන්සේගේ අඩි පාරේ යන පිණිස නුඹලාට ආදර්ශයක් දී ගියසේක.*

ඔබේ ජීවිතයේ ඔබ දරා සිටින කුරුස මොනවාද? කුරුස විවධ හැඩයන් සහ ප්‍රමාණවලින් පැමිණිය හැකිය: නිවසේදී, රැකියාවේදී හෝ පාසැලේදී මුහුණ දෙන දුෂ්කර තත්වයක් ලෙස එය පැමිණිය හැකිය. නිදන්ගත සෞඛ්‍ය තත්වයක්, ඔබේ බලාපොරොත්තු සහ සිහින නැවත බොදවී යන තත්වයක් ලෙස එය පැමිණිය හැකිය.

සමහර කුරුස, කාලයකට සීමා වෙයි. අනෙක් ඒවා මුළු ජීවිත කාලය පුරාම දැරිය යුතුය. දෙවියන් වහන්සේ ගැන දැනුවත්ව සිටියදී අපි අපගේ කුරුස දරාගත යුතුය (1 පේතෘස් 2: 19).

ජීවිතයේ කුරුස ගැන මෙනෙහි කිරීමට යම් කාලයක් ගත කරන්න. ඒවා එකින් එක දෙවියන් ඉදිරියට ගෙනෙන්න. දෙවියන් වහන්සේගේ කරුණාවෙන් ඒවා දරා ගැනීමට ශක්තිය ඉල්ලා සිටින්න. ස්වයං අනුකම්පාවකට හෝ සංසන්දනයකට පත් නොවී දුක් වේදනා මධ්‍යයේ පවා ඔබ දිගටම උන්වහන්සේව මහිමයට පත් කර උන්වහන්සේ කෙරෙහි අවධානය යොමු කිරීමට ශක්තිය ලබා දෙන ලෙස දෙවියන්ගෙන් ඉල්ලන්න.

## Prayer - යාච්ඤාව

*ස්වාමීනි, මම මගේ ප්‍රශ්න වලට මුහුණ දෙන විට, මගේ ආත්ම අනුකම්පාව සහ ස්වයං වරද තැබීම් පිළිබඳ මගේ ආකල්පවලට සමාව දෙන්න. ප්‍රශ්න එනවිට, ඔබ වහන්සේව ආදර්ශයට ගන්නා කෙනෙකු ලෙස ඔවුන්ව දරා ගැනීමට මට ශක්තිය දෙන්න. වේදනාව සහ දුෂ්කරතා මැද ඔබ වහන්සේ ගැන දැනුවත්ව සිටීමට මට උදව් කරන්න. නිරන්තරයෙන්, මගේ දුර්වලකම තුළ ඔබගේ සර්වබලධාරී කරුණාව කෙරෙහි විශ්වාසය තැබීමට මා පෙලඹී ඇති බවත්, ඒ නිසාම, මගේ දුර්වලතාවය තුළ ඔබගේ ශක්තිය පරිපූර්ණ වූ බවත් මතක තබා ගැනීමට මට උපකාර කරන්න. ආමෙන්.*

## Station 4: Simon Carries the Cross - 4 වන ස්ථානය: සීමොන් කුරුසය රැගෙන යෑම.

## Scripture Passage - ශුද්ධ ලියවිලි පාඨය (මතෙව් 27: 32)

*32ඔව්හු නික්ම යද්දී සීමොන් නම් කිරේනියේ මනුෂ්‍යයෙකු සම්බවී, උන්වහන්සේගේ කුරුසිය උසුලාගෙන යන්ට ඔහුට බලකළෝය.*

## Personal Reading: පුද්ගලික කියවීම.

ජේසුනි, ඔබ උසුලන ඒ කුරුසියේ විශාල බරක් තිබෙන බව මට සිතාගත හැකිය. සහ කුරුසියේ බර නිසා, ඔබ නැවත නැවතත් කුරුසිය යට වැටෙනවා. ඔබේ ශාරීරික ශක්තිය හීන වන බව මම දනිමි, සොල්දාදුවන් ද එය හඳුනා ගෙන තිබෙන බව මම දනිමි.

සිරේනියේ සිට පැමිනි සීමොන් ඒ අසලින් ගමන් කරමින් සිටියේය. සහ, කුරුසියේ ඇණ ගැසීම සඳහා ඔබේ ශක්තිය සුරැකීමට ඔබේ කුරුසිය රැගෙන යාමට ඔහුට බල කෙරුනි. මම එහි සිටියා නම්, මම සෙනඟ අතරින් දිව ගොස් ඔබට උදව් කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වනු ඇතැයි සිතීමට කැමැත්තෙමි. නමුත් මොහොතකට ඔබේ දුක් වේදනා සමනය කිරීම සඳහා මම සියල්ල අවදානමට ලක් කිරීමට සූදානම්ද?

ඊට අමතරව, මට දැනටමත් දරා ගැනීමට මගේම කුරුස තිබේ. ඉතින්, මම උදව් කිරීමට ඉදිරිපත් වෙනවා වෙනුවට, සමූහයා තුළ නොපෙනී සිටීමට උත්සාහ කරමි. මා වටා ඇති අවශ්‍යතා, දුක සහ දුක් වේදනා නොදැක්කා සේ පෙනී සිටීම පහසුය. බොහෝ ආකාරවලින් පැමිණෙන උදව් ඉල්ලා කැගැසීම් නොඇසෙන ලෙස පෙනී සිටීම පහසුය. මම කාර්යබහුල බව හෝ වෙහෙසට පත් වී ඇති බව හෝ මගේ ප්‍රශ්න මට තිබෙව බව මට ඒත්තු ගැන්වීම පහසුය.

නමුත් මම සිරේනියේ සීමොන්ගේ ආදර්ශය දෙස බලන විට, මම එය තුළ දකින්නේ ගෝලත්වයේ මාවතේ ගමන් කිරීමට කරන ආරාධනයකි.

## Reflection - <u>පුද්ගලික ආවර්ජනය</u> (ගලාති 6: 2)

*2එකිනෙකාගේ බර උසුලා, එසේ ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථාව සම්පූර්ණකරන්න.*

අප එකිනෙකාගේ බර උසුලන විට, ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථාව, ප්‍රේමයේ නීතිය, ඒ තුල සම්පූර්ණ වේ. අන්‍යයන්ගේ බර ඉසිලීමට උන්වහන්සේගේ පෙළඹවීම ඔබ නොසලකා හැර ඇති ආකාරය ඔබට හෙළි කරන ලෙස ශුද්ධාත්මයාණන්ගෙන් ඉල්ලා යාච්ඤාවේ යම් කාලයක් ගත කරන්න. සහ මෙයින් අපි හැමෝගෙම ප්‍රශ්න විසඳිය යුතුයි කියලා අදහස් වෙන්නේ නැහැ. නමුත් යේසුස්වහන්සේ අපව කැඳවා ඇත්තේ, නිශ්චිත හා සංයුක්ත ආකාරවලින්, උන්වහන්සේගේ ප්‍රේමයේ මාර්ගයක් වීමටය.

දැන්, ඔබව උන්වහන්සේගේ ප්‍රේමයෙන් පුරවන්න කියා, යේසුස්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

***Prayer* - යාච්ඤාව**

**ස්වාමීනි, මා වටා සිටින අයගේ ශෝකය හා දුක් වේදනා ගැන, සොයා නොබලා, මා ගැනම උනන්දු වීම ගැන මට සමාව දෙන්න. මා වටා සිටින අයට ආදරය නොකර මට ඔබට ආදරය කළ නොහැකි බව මට නිතරම මතක් කර දුන මැනව. ඔබගේ ආදරයෙන් සහ කරුණාවෙන් මා නැවත වරක් පුරවන්න.**

**ආමෙන්**

## Station 5: Jesus Is Crucified - 5 වන ස්ථානය: ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසීම.

**Scripture Passage - ශුද්ධ ලියවිලි පාඨය (මතෙව් 27: 35-40)**

***35උන්වහන්සේ කුරුසියෙහි ඇණගැසූ පසු ඔව්හු උන්වහන්සේගේ ඇඳුම් දාදුදමා බෙදාගත්තෝය. 36ඔව්හු එහි හිඳගන උන්වහන්සේ රැකවල්කළෝය. 37තවද; මොහු යුදෙව්වරුන්ගේ රජවූ යේසුස්ය කියා උන්වහන්සේගේ වරද ලියා උන්වහන්සේගේ හිසට උඩින් තැබුවෝය. 38එවිට සොරු දෙදෙනෙක්, එක්කෙනෙක් දකුණු පැත්තෙහිද එක්කෙනෙක් වම් පැත්තෙහිද, උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබුවෝය. 39මග යන්නෝ තමුන්ගේ හිස් වන වනා උන්වහන්සේට නින්දාකරමින්: 40දේවමාළිගාව කඩාදමා තුන් දවසකින් ගොඩනගන්නාවූ නුඹ නුඹම ගළවා ගන්න. නුඹ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් කුරුසියෙන් බසින්නැයි කීවෝය.***

**Personal Reading - පුද්ගලික කියවීම.**

**ජේසුනි ඔබගේ කුරුස පත්වීම මට බලන්න බැරිය. නමුත් අමාරුවෙන් එය බලන විට, මට ඔබගේ නිර්මල ශරීරයට එරෙහිව ඇණ ගසන්නා වූ හඩ ඇසෙයි. ඔබ ලෝකයට ආලෝකයක් ලෙස කතා කළ නමුත් අන්ධකාරය ජය ගන්නා බව පෙනෙයි.**

රෝමවරුන්ගේ කෲරත්වය. උත්තම පූජකයාගේ සහ ආගමික නායකයන්ගේ කුහකකම. ගෝලයන්ගේ නිවටකම. ජුදාස්ගේ ද්‍රෝහීකම. සෙනඟගේ චපල බව. මේ දේවල් දකින විට ඔවුන්ට විරුද්ධව මගේ කෝපය අවිලෙයි.

නමුත් ඔබේ මරණයට වැරදිකරුවන් වන්නේ ඔවුන් පමණක්ද? එසේත් නැතිනම්, උන්වහන්සේව ඇණ ගසන්නේ, මිනිසාගේ පාපය නිසාද? මගේ පව් ති න්නේද, නමුත් මම එය පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමට වෙර දරයි. සහ එය වෙනත් කෙනෙකුගේ වරදක්, වෙනත් කෙනෙකුගේ පාපයක් ලෙස පෙන්නුම් කිරීමට මම උත්සහකරයි. නමුත් යේසුනී, ඔබට ඇණ ගසන්නේ මගේ පාපය නිසාය. මගේ පාපයට දඬුවම ඔබ උසුලාගත් නිසාය. ඔබට ඇණ ගසන්නේ මමය.

## <u>Personal reflection - පුද්ගලික ආවර්ජනය</u> (යෙසායා 53: 3 - 6)

ජේසුස් වහන්සේ කුරුසියේදී කළ දේ විස්තරාත්මකව පැහැදිලි කරන පහත ඡේදය කියවන්න.

3උන්වහන්සේ මනුෂ්‍යයන් විසින් සුළුකොට එපාකරනු ලැබූසේක; වේදනා ඇත්තාවූ දුක දන්නාවූ මනුෂ්‍යයෙක්ය. මනුෂ්‍යයන් විසින් තමුන්ගේ මුහුණ සඟවාගන්න කෙනෙකු මෙන්, උන්වහන්සේ සුළුකරනු ලැබූසේක, අපිද උන්වහන්සේ නොසැලකුවෙමුව. 4සැබවින්ම උන්වහන්සේ උසුලාගත්තේ අපේ දුක්ය, දරාගත්තේ අපේ ශෝකය. එසේ වී නුමුත් උන්වහන්සේ දඬුවමද දෙවියන්වහන්සේගෙන් පහරද පීඩාවද ලැබූ කෙනෙකැයි අපි සිතීමුව. 5නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය, පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුණේය; උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ. 6අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළාවී, එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව; ස්වාමීන්වහන්සේද අප සියල්ලන්ගේ අයුතුකම උන්වහන්සේ පිට තැබූසේක.

නමුත් දැන් අපි කියන ස්ථානයට මම යොදා නැවත යෙසායා 53: 4 – 6 දක්වා කියවන්න.

4සැබවින්ම උන්වහන්සේ උසුලාගත්තේ මගේ දුක්ය, දරාගත්තේ මගේ ශෝකය. එසේ වී නුමුත් උන්වහන්සේ දඬුවමද දෙවියන්වහන්සේගෙන් පහරද පීඩාවද ලැබූ කෙනෙකැයි මම සිතීමුව. 5නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ

මගේ අපරාධ නිසාය, පොඩිකරනු ලැබුවේ මගේ අයුතුකම් නිසාය. මට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුණේය; උන්වහන්සේගේ පහරවලින් මට සුවය ලැබී තිබේ. 6මම බැටළුවන් මෙන් මුළාවී, මාගේම මාර්ගයට හැරී ගියෙමුව; ස්වාමීන්වහන්සේද මගේ අයුතුකම උන්වහන්සේ පිට තැබූසේක.

## Prayer - යාච්ඥාව

ජේසු සමිඳුනි, මාගේ පාපයේ මාරාන්තික මිලය, ඔබගේ කුරුසිය තුළින් මම දකිමි. මම කල ඔබ වහන්සේ අසතුටට පත් වන දේවල් වලට මට සමාව දුන මැනව. මගේ හදවතේ මා සඟවාගෙන සිටින අන්ධකාරය සමඟ කටයුතු කිරීමට ඔබට ඉඩ නොදීම ගැන මට සමාව දෙන්න. මා කළ යුතුව තිබූ දේවල් නොකර සිටීම නිසා සහ එයට නිදහසට කරුණු කීම නිසා මට සමා දුන මැනව. මම මගේ පාපයට පසුතැවිලි නොවීම ගැන මට සමාව දුන මැනව. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන්.

ආමෙන්.

## Station 6: Jesus Dies on the Cross - 6 වන ස්ථානය: ජේසුස් වහන්සේ කුරුසියේ මිය යෑම.

## Scripture Passage - ශුද්ධ ලියවිලි පාඨය (මතෙව් 27: 45-54)

*45සවෙනි පැය පටන් නවවෙනි පැය දක්වා දේශය මුළුල්ලෙහි අන්ධකාරයක්*
*විය. 46නවවෙනි පැය පමණේදී යේසුස්වහන්සේ: ඒලී, ඒලී, ලාමා සබක්තානි*
*කියා මහත් ශබ්දයකින් මොරගැසූසේක. එහි අර්ථය නම්, මාගේ දෙවියනි,*
*මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මක්නිසාද යනුයි. 47එහි සිටියවුන්ගෙන්*
*සමහරෙක් ඒ අසා: මොහු එලියාට අඬගසන්නේයයි*
*කීවෝය. 48එකෙණෙහිම ඔවුන්ගෙන් එක්කෙනෙක් දිව ගොස්, මූදුහත්තක්*
*ගෙන කාඩියෙන් පොඟවා බටදණ්ඩක ගසා, උන්වහන්සේට බොන්ට*
*දුන්නේය. 49සෙස්සෝ කථාකොට: නිකම් සිටින්න; මොහු ගළවන්ට එලියා*
*එන්නේද කියා බලමුයයි කීවෝය. 50යේසුස්වහන්සේ නැවතත් මහත්*
*ශබ්දයකින් හඬනගා ආත්මය හළසේක. 51බලව, දේවමාළිගාවේ තිරය ඉහළ*

*පටන් පහළට දෙකඩව ඉරුණේය; පොළොව කම්පාවූවාය;* ***52****පර්වත පැළුණේය; සොහොන් ගෙවල්ද ඇරුණේය; සැතපී හුන්නාවූ නොයෙක් ශුද්ධවරයන්ගේ ශරීර නැගුටුවනලදුව,* ***53****ඔව්හු උන්වහන්සේ නැගුටුණු පසු සොහොන් ගෙවලින් නික්ම ශුද්ධ නුවරට ඇතුල්ව, බොහෝ දෙනෙකුට පෙනුණේය.* ***54****සියයකට මුලාදෑනියාද ඔහු සමඟ යේසුස්වහන්සේ රැකවල්කරමින් සිටි අයද පොළෝකම්පාවත් සිදුවූ දේත් දැක ඉතා භයපත්ව: සැබවින්ම මුන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයායයි කීවෝය.*

## Personal reading - පුද්ගලික කියවීම.

දවල්ට ආලෝකය තිබුනත් කළුවර වගේ දැනෙයි. අහස පොළොව ශෝක වන බව පෙනේ. ජේසුනි, ඔබ ගීතාවලියෙන් විලාප නඟන අතර මෙය මිනිස් වේදනාවේ හා පාළුවීමේ කෑගැසීම බව මම දනිමි. ඔබ වහන්සේ සැබෑ දෙවියන්වහන්සේ ලෙස සිටින අතර ඔබ ඔබගේ ප්‍රේමයේ යටහත් කම කුරුසිය තුළින් අපට පෙන්වා ඇත.

සියල්ල නිමා විය. පොළොව කම්පා වෙයි. දේවමාළිගාවේ තිරය හරි මැදින් ඉරා යයි. අතිශුද්ධස්ථානය සියලු දෙනාටම දැකීමට නිරාවරණය වෙයි. එයින් අදහස් කරන්නේ කුමක් ද? ඇත්තටම ඔබ කවුද? රෝම ජාතිකයන් පවා දැන් සිතන්නේ ඔබ දෙවියන්ගේ පුත්‍රයා බවයි. ඒත් ඔබ මියගොස් ඇත. ඔබ වහන්සේ දරගත්තේ මගේ පාපයයි.

නමුත් ඔබ වහන්සේ මැරෙනකම්ම මට ආදරේ කරන එක නතර කළේ නැත. ඔබ මැරුණේ මනුෂ්‍යයාගේ පාප නිසාය, මාගේ පාප නිසාය. නමුත් පාපය අවසාන වචනය නොවන බව මම දනිමි. මිනිසුන්ට කළ හැකි නරකම දේ කලත් ඔවුන්ව ඔබට මුදවා ගත හැකිය.

## Personal Reflection - පුද්ගලික ආවර්ජනය (රෝම 5: 6 - 8)

***6****මක්නිසාද අප දුර්වලව සිටියදීම නියම කාලයේදී ක්‍රිස්තුස්වහන්සේ අභක්තිකයන් උදෙසා මළසේක. 7ධර්මිෂ්ඨයෙකු උදෙසා යමෙකු මැරෙන්ට කැමතිවීම දුර්ලභය. සමහරවිට සත්පුරුෂයා උදෙසා මැරෙන්ට යමෙකු ධෛර්ය ඇතුව සිටින්ට පුළුවන.* ***8****නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේගේ මරණය විඳීමෙන්ය.*

ශුද්ධ සහබාගී කම යනු ජේසුස් වහන්සේ තම ස්වාමියා සහ ගැලවුම්කරුවා ලෙස විශ්වාස කරන සැමට විවෘත සක්‍රමේන්තුවකි. ඒ තුළින් ඇදහිලිවන්තයන් යේසුස් වහන්සේ කුරුසියේදී කළ දේ සිහිපත් කරන අතර, අප කෙරෙහි උන් වහන්සේගේ ප්‍රේමයේ තරම පිළිබිඹු කරයි.

මෙම ස්ථානයේ, ඔබ ශුද්ධ සහබාගී කමට සහභාගි වීමට කාලය ගත කරනු ඇත. මෙම ක්‍රියාවලියට ඔබට මග පෙන්වීම සඳහා පහත පියවරයන් අනුගමනය කරන්න. මෙය ඔබ මෙනෙහි කරමින් මෙම සක්‍රමේන්තුවේ වැදගත්කමෙහි ගිල්වන පූජනීය මොහොතකි - එම නිසා, මෙහි ඔබට අවශ්‍ය කාලයක් ගත කරන්න.

## Preparation for the Holy Communion - ශුද්ධ වූ හවුල සඳහා සූදානම් වීම.

මේසයේ තබා ඇති ශුද්ධ සහභාගී කමට අවශ්‍ය, රොටී සහ මිදි යුෂ ගන්න.

දේව වචනය කියවීමෙන් ආරම්භ කරන්න: (1 කොරින්ති 11: 23 - 26)



23මක්නිසාද මම නුඹලාට
භාරදුන් දේ
ස්වාමීන්වහන්සේගෙන් ලැබීමි,
එනම් ස්වාමිවූ යේසුස්වහන්සේ
පාවාදෙනු ලැබූ රාත්‍රියේදී
උන්වහන්සේ රොටි
රැගෙන, 24ස්තුතිකොට, කඩා:
මේක නුඹලා උදෙසා දෙන්නාවූ
මාගේ ශරීරයය. මා සිහිකිරීම
පිණිස මේක කරන්නැයි
කීසේක. 25එලෙසම රාත්‍රි
කෑමෙන් පසු කුසලානත් දී: මේ
කුසලාන මාගේ ලෙයින්
පිහිටුවන අලුත් ගිවිසුමය. යම් පමණ වර නුඹලා මෙයින් බොන්නහුද,
එපමණ වර මා සිහිකිරීම පිණිස මේක කරන්නැයි කීසේක. 26මක්නිසාද,
නුඹලා යම් පමණ වරක් මේ රොටි කන්නහුද කුසලානෙන් බොන්නහුද

එපමණ වරක් ස්වාමීන්වහන්සේ එන තුරු නුඹලා උන්වහන්සේගේ මරණය ප්‍රකාශකරන්නහුය.

## Prayer - යාච්ඤාව

ශුද්ධ සහාභාගී කම ඔබේ අතේ තබාගෙන, ඔබට පහත ලියා ඇති යාච්ඤාව හෝ ඔබේම ස්තුති දීමේ යාච්ඤාවක් යාච්ඤා කළ හැකිය.

ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්ස, ඔබ වහන්සේ, මුළු මිනිස් වර්ගයා වෙනුවෙන් සහ මා වෙනුවෙන් කල්වාරි කුරුසියේදී ඔබේ ජීවිතය පූෂා කිරීම ගැන මම ඔබට ස්තූතිවන්ත වෙමි.

කුරුසියේදී, මගේ සියලු විනිශ්චය සහ දඬුවම, මා වෙනුවට ඔබ වහන්සේ උසුලා ගත් සේක. මාගේ පාපය ඔබ වහන්සේ මතට රැගෙන, ඔබවහන්සේගේ ධර්මිස්ට කම මට ලබා දුන් සේක.

යේසුස් වහන්සේ,

ඔබ වහන්සේ දඬුවම් ලබපු නිසා, මට සමාව ලැබී ඇත.

ඔබ වහන්සේගේ තුවාල වලින් මාව සුව කරණු ලැබුවහුය.

මාගේ පාපය නිසා, ඔබ වහන්සේව, පාපය වන්නට සැලැස් වූ නිසා, ඔබ වහන්සේගේ ධර්මිස්ඨ කමෙන්, මාව ධර්මිස්ඨ කල සේක.

මා වෙනුවට ඔබ වහන්සේ මරණය පත්වූ නිසා, මට ජීවනය ලැබිනි.

මට ආශීර්වාදය ලැබෙන පිණිස ඔබ වහන්සේ ශාපය උසුලාගත් සේක.

ඔබ දරිද්‍රතාවය විඳදරාගත්තේ, ඔබේ බහුලත්වය මට බෙදා දීමටය.

ඔබ වහන්සේගේ මහිමය මා සමග බෙදා ගැනීමට, ඔබ වහන්සේ මගේ ලැජ්ජාව දරා ගත්තේය.

ඔබ වහන්සේ මගේ ප්‍රතික්ෂේප කිරීම විඳදරා ගත්තේ ඔබ වහන්සේගේ පිළිගැනීම මට භුක්ති විඳීමටයි.

**මගේ පැරණි දූෂිත ආත්මය, ඔබ වහන්සේ තුළ මිය ගියේය, මගේ නව ආත්මය, ක්‍රිස්තුස් වහන්සේ තුළ මගේ අලුත් ස්වභාවය, අලුත් ජීවිතය මා තුළ ජීවත් වනු ඇත.**

ජේසුනි, ඔබ මා වෙනුවෙන් කළ සෑම දෙයකටම මම ඔබට ස්තුතිවන්ත වෙමි. මම මෙම රොටියට සහ මිදියුෂට සහභාගී වන විට, එය මට ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ සහ රුධිරයේ පංගුකාරයෙක් වේවායි මම යාච්ඤා කරමි.


**ආමෙන්.**

## Partaking the Holy Communion - ශුද්ධ සහාභාගී කමට සහභාගී වීම

මෙම රොටියට සහ මිදියුෂට සහභාගී වන්න, ඉන් අනතුරුව යේසුස් වහන්සේගේ පූජාව ගැන මෙනෙහි කරන්න. ඔබගේ ජීවිතයට අදාල කරගත හැකි දේවල් මෙනෙහි කරන්න. ඔබ උදෙසා දෙවියන් වහන්සේගේ ප්‍රේමය පිළිබදව මෙනෙහි කරන්න.

# Easter Encounter (Lvl 3) – 3 වන මහලේ - පාස්කු හමුවීම පිළිබඳ දළ විශ්ලේෂණය

## Easter - පාස්කුව (මතෙව් 28: 1 - 9)



**1සබත් දවස නිමවන්ට ළංව සතියේ පළමුවෙනි දවසට එළිවෙන වේලෙහි, මග්දලායේ මරියාද අනික් මරියාද සොහොන්ගෙය බලන්ට ගියෝය. 2එවිට මහත් පොළෝකම්පාවක් විය; මක්නිසාද ස්වාමීන්වහන්සේගේ දූතයෙක් ස්වර්ගයෙන් බැස ඇවිත්, ගල අහකට පෙරළා, ඒ පිට**

ඉඳගත්තේය. 3ඔහුගේ පෙනීම විදුලිය මෙන් වූය, ඔහුගේ වස්ත්‍ර හිම මෙන් සුදුව තිබුණේය. 4රැකවල්ලු ඔහුට හයින් වෙවුලා මළවුන් සේ වූහ. 5දේවදූතයා ඒ ස්ත්‍රීන්ට කථාකරමින්: භය නොවෙන්න; මක්නිසාද කුරුසියෙහි ඇණ ගසනලද යේසුස්වහන්සේව නුඹලා සොයන බව දනිමි. 6උන්වහන්සේ මෙහි නැත; උන්වහන්සේ කී ලෙසම නැගුටුණුසේක. එන්න, ස්වාමීන්වහන්සේ උන් ස්ථානය බලා ඉක්මනින් ගොස්, 7උන්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණුසේක කියා උන්වහන්සේගේ ගෝලයන්ට කියන්න; උන්වහන්සේ නුඹලාට පළමු ගලීලයට යනසේක; එහිදී නුඹලා උන්වහන්සේ දකින්නහුය. බලන්න, නුඹලාට කීයෙමියි කීවේය. 8එවිට ඔව්හු හයින්ද මහත් ප්‍රීතියෙන්ද සොහොන් ගෙයින් ඉක්මනින් නික්ම ගොස්, උන්වහන්සේගේ ගෝලයන්ට දන්වන පිණිස දිවුවෝය. 9එකල යේසුස්වහන්සේ ඔවුන්ට සම්මුඛවී: ශුභසිද්ධවේවයි කීසේක. ඔව්හු ළඟට ඇවිත් උන්වහන්සේගේ පාද වැළඳගෙන, උන්වහන්සේට නමස්කාරකළෝය.

යේසුස් වහන්සේ අපගේ පව් උදෙසා කුරුසියේ මිය ගියා පමණක් නොව, උන්වහන්සේ නැවත උත්තාන කරණු ලැබීය. තවද ජේසුස් වහන්සේ අදහන සියල්ලෝ ද උන් වහන්සේ සමඟ නැගිට, උන් වහන්සේ සමඟ ස්වර්ගීය තලයේ, දෙවියන් වහන්සේගේ දකුණු පස වාඩි වීය, සහ සෑම අධ්‍යාත්මික ආශිර්වාදයකින් ම ආශීර්වාද ලබා ඇත. (එපීස 1).

3 වන මහලේ, ඇති ස්ථානවලින්, නැවත නැඟිටීමේ (පාස්කු) ඉරිදා වැදගත්කම ගැන, අපගේ ජීවිතයට අදාල කරගෙන අපි මෙනෙහි කරමු.

There are 4 stations in total - මුළු ස්ථාන ගණන 4 කි.

1. ක්‍රිස්තුස් වහන්සේ තුළ නව ජීවිතය
2. අනාවැකිමය යාච්ඤාව
3. අතීතයෙන් සමුගැනීම්
4. දෙවියන් වහන්සේගේ එළිදරව්ව සහ එහි අදහස චිත්‍රයට නැගීම

## Format for Easter stations - පාස්කු ඉරිදා ස්ථාන සඳහා ආකෘතිය.

1. මෙම ස්ථානය කුමක් ගැනද?

ස්ථානයෙහි වැදගත්කම සහ අර්ථය

2. ඔබ කරන්නේ කුමක්ද?

ආවර්ජනය කිරීමේ ලක්ෂ්‍යණ + මෙම ස්ථානයේ කල යුතු ක්‍රියා

# A new you in Christ - ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔබ අලුත් කෙනෙක්

## What is this station about - මෙම ස්ථානය කුමක් ගැනද?

මෙම ස්ථානයේදී, අපි ජේසුස් වහන්සේ තුළ අපගේ නව අනන්‍යතාවය පිළිබිඹු කරමු.

### 2 කොරින්ති 5:17

'එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත්වී තිබේ. '

ජේසුස් වහන්සේ අදහන සියල්ලන්ට නව අනන්‍යතාවයක් ලබා දී ඇත - ඔවුන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ නව මැවිල්ලකි. මෙය දෙවියන් වහන්සේ විසින් ලබා දුන් වරප්‍රසාදයකි, එය ඔබ උපයාගත් දෙයක් නොවෙයි, - එය සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ අනුග්‍රහයයි! කෙසේ වෙතත්, අපට බොහෝ විට සැබවින්ම යේසුස් වහන්සේ තුළ අපි කවුරුන්ද යන්න අමතක කර, අපගේ පැරණි අනන්‍යතා, අපගේ අතීත පැවැත්මේ රටාවන් තුළ ජීවත් වීමට යොමු වේ.

අපි නිතරම දෙවියන් වහන්සේගේ වචනයට ආපසු යා යුතු අතර අප සැබවින්ම කවුරුන්ද යන්න මතක තබා ගැනීමට පොරොන්දු වෙමු.

## What are we supposed to do - අපි කුමක් කල යුතුද?

කූඩයේ ඇති සෑම කොලයකම බයිබල් පදයක් ඇත. කොල 2 ක් හෝ 3 ක්, ගෙන, සෑම කොලයකම යේසුස් වහන්සේ තුළ ඔබගේ අනන්‍යතාවයේ අංගයක් තහවුරු කරන බයිබල් පදයක් ඇත. ඔබේ ජීවිතයට විශේෂයෙන් අදහස් කරන්නේ කුමක්දැයි දෙවියන්ගෙන් අසමින් ඒ ගැන මෙනෙහි කිරීමට යම් කාලයක් ගත කරන්න?

සෑම ස්ථානයකම දර්පණයක් ද ලබා දී ඇත. බොහෝ විට, අපි දර්පණය දෙස බලන විට, අපි අපගේ - පෙනුමට අවදානයක් ලබා දෙයි. නමුත් මේ අවස්ථාවේ දී, අපගේ දුර්වලතා කෙරෙහි අවධානය යොමු කිරීමට නැඹුරු වෙමු.

**(කොලොස්සි 1:22)**

22ශුද්ධවූ නොකැලැල්වූ නිදොස්වූ තැනැත්තන් කොට තමන්වහන්සේ ඉදිරියෙහි ඔප්පුකරගන්න පිණිස, උන්වහන්සේගේ මාංසමයවූ ශරීරයෙහි මරණය කරණකොටගෙන සමඟිකරගත්සේක.

## Prophetic Prayer - අනාවැකිමය යාච්ඤාව

## What is this station about - මෙම ස්ථානය කුමක් ගැනද?

**(1 කොරින්ති 14:3)**

3නුමුත් ධර්මවාක්‍ය පවසන්නා වර්ධනවීමද දැනමුතුකමද සැනසීමද පිණිස මනුෂ්‍යයන්ට කථාකරන්නේය.

**(1 කොරින්ති 14: 25)**

25ඔහුගේ සිතේ රහස් එළිදරව්වන්නේය; මෙසේ ඔහු සැබවින් දෙවියන්වහන්සේ නුඹලා අතරෙහියයි ප්‍රකාශකරමින්, මුහුණින් වැටී දෙවියන්වහන්සේට නමස්කාරකරන්නේය.

පාවුල් තුමා සභාවට පවසන්නේ උනන්දුවෙන් මෙම දීමනාව සොයන ලෙසයි. මක්නිසාද අනාවැකියේ දීමනාව සභාව ගොඩනඟයි - 1 කොරින්ති 14: 3 පවසන පරිදි: "එය මිනිසුන්ව ශක්තිමත් කරයි, දිරිගන්වයි සහ

සනසයි". මෙම ස්ථානයේ, ඔබ වෙනුවෙන් අනාවැකිමය ලෙස යාච්ඤා කරනු ඇත.

## What do we do - අපි මොකද කරන්නේ?

### 1 තෙසලොනික 5: 19-22

9ආත්මයාණන්වහන්සේ නොනිවන්න; 20අනාගතවාක්‍යකීම් සුළුකොට
නොසිතන්න; 21සියල්ල සෝදිසිකර බලා, යහපත් දේ තදින්
අල්ලාගන්න; 22සියලු අන්දම්වල නපුරෙන් වැලකෙන්න.

යාච්ඤාව ලබාගැනීමට මෙම ස්ථානයේ තිබෙන කුටිවලින් එකකට යන්න. කරුණා කර පෝලිමක් ඇති නම්, පෝලිමේ ගමන් කරන්න. නැතහොත් ඔබට වෙනත් ස්ථානයකට යා හැකිය.

## Past Goodbye - අතීතයෙන් සමුගැනීම.

## What is this station about - මෙම ස්ථානය කුමක් ගැනද?

### (රෝම 6: 6, 7, 11)

6මින්මතු අපි පාපයට සේවය නොකරන ලෙස පාප ශරීරය නැතිවන පිණිස, අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනලද බව දනිමුව. 7මක්නිසාද මැරුණාවූ තැනැත්තේ පාපය ගැන නිර්දෝෂකරනු ලැබ සිටියි.

11එලෙසම නුඹලාත් පාපයට මැරී සිටින්නන් කොටද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන්වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද සිතාගන්න.

අපගේ ජීවිතයට යේසුස් වහන්සේව පිළිගන්නා සියල්ලන්ම දැනටමත් ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියේ ඇණ ගසා ඇත, එබැවින්, අප පාපයට මිය ගොස්, අපගේ පැරණි ජීවන රටාවට සහ මිය ගිය අය ලෙස ගණන් ගත යුතුය.

## What do you do? ඔබ මොකද කරන්නේ?

**ඔබගේ ජීවිතයේ ඔබට 'ඉවත් කිරීමට' අවශ්‍ය පැරණි කොටස් මොනවාද?**

මේවා (ඕපාදූප හෝ අන් අයගේ ඊර්ෂ්‍යාව වැනි), හුරුපුරුදු පාපයක් විය හැකිය. එය ලෞකික ජීවන රටාවන් / සිතීමේ රටාවන් (සමාජ මාධ්‍යවලට ඇබ්බැහි වීම, මුදල් පිළිබඳ නිරන්තර කනස්සල්ල) යනාදිය විය හැකිය. ඔබට අවශ්‍ය කාලය ගෙන, ඔබේ ජීවන රටාව නිවැරදිව පරීක්ෂා කරන්න. දැන්, ඔබට ඉවත් කිරීමට අවශ්‍ය පැරණි ආත්මයේ කොටස් ලබා දී ඇති කඩදාසි කැබැල්ලේ ලියන්න.

**ඔබ ලියා අවසන් වූ පසු, මෙය ප්‍රකාශ කරන්න:**

ඔබ එසේ කරන විට, මෙසේ කියන්න.

"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියේ ඇණ ගසනු ලැබ සිටිමි, මම තවදුරටත් පාපයේ වහලෙකු නොවෙමි. [මෙම පාපයන්ට] මා මිය ගිය බව මම ගණන් ගන්නෙමි. ක්‍රිස්තුස් වහන්සේ තුළ මගේ නව ජීවිතය ගත කිරීමට මම දෙවියන් වහන්සේගේ කරුණාව මත රඳා සිටිමි. මාගේ පව් කමා කර මාගේ අධර්මිෂ්ඨකමින් මා පවිත්‍ර කිරීමට ඔබ වහන්සේ විශ්වාසවන්ත හා ධර්මිෂ්ඨ බව මම විස්වස කරමි.

**(පසුව, මෙම කඩදාසි කැබලි ඉවත දමා පුළුස්සා දමනු ඇත.)**

ඔබ ලියා ඇති කඩදාසි කැබැල්ල නමා එය කුරුසියේ සවි කරන්න. මෙය ඔබගේ පැරණි ආත්මය කුරුසියේ ඇණ ගැසීම සහ කුරුසියේ ඇණ ගැසීම සංකේතවත් කරයි.

## Soaking in God's presence + drawing - දෙවියන් වහන්සේගේ එළිදරව්ව සහ එහි අදහස චිත්‍රයට නැගීම.

## What is this station about - මෙම ස්ථානය කුමක් ගැනද?

දෙවියන්වහන්සේගේ අභිමුඛයේ ගිලීමට සහ දෙවියන්වහන්සේට ළංවීමට, උන්වහන්සේ සමග අපගේ සමීපත්වය වර්ධනය කිරීමට කාලයකි.

(ගීතාවලිය 27: 8)

8මාගේ මුහුණ සොයව්යයි ඔබ කීකල, ස්වාමිනි, ඔබගේ මුහුණ සොයන්නෙමියි මාගේ සිත ඔබට කීය.

නමස්කාරය තුළින් අපි අපගේ හදවත් දෙවියන් වහන්සේ වෙත යොමු කරමු. අප දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සිටින විට, වැදගත් වන්නේ, යාච්ඤාවෙන් වෙහෙසීම වෙනුවට උන්වහන්සේගේ ප්‍රේමය තුළ විවේක ගැනීමයි.

## What do we do - අපි මොකද කරන්නේ?

දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයට අපට ඇතුළු විය හැකි ඉරියව්.

- දෙවියන් වහන්සේට නමස්කාර කිරීම (මෙම ස්ථානයේ පටිගත කරන ලද නමස්කාර ගීත සමඟ සජීවී නමස්කාරයක් ඇත)
- උන්වහන්සේ කවුද යන්න ගැන මෙනෙහි කිරීම සහ සිත යොමු කිරීම (අපි වෙනුවෙන් ඇති උන්වහන්සේගේ චරිතය සහ යහපත්කම)
- ඔබගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ පූර්ණත්වය සහ අභිමුඛත්වය වැඩි වශයෙන් ඉල්ලා සිටීම.
- නිශ්චලව සිටීම සහ දෙවියන් වහන්සේගේ හඬට සවන් දීම.

මෙම ස්ථානයේ ඔබට කළ හැකි තවත් දෙයක් නම් අනාවැකිමය චිත්‍ර ඇඳීමයි. බොහෝ මිනිසුන් ස්වභාවිකව දෘශ්‍යමාන වන අතර, දෙවියන් වහන්සේට රූප මගින් ඔවුන් සමඟ කතා කළ හැකිය. ඔබ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයට තුල සිටින විට, ඔබේ මනසට රූප හෙළි කරන ලෙස ඔබට දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිය හැකිය.

නැවතුම්පළ තුල චිත්‍ර ඇඳීමට අවශ්‍ය ද්‍රව්‍ය (කඩදාසි, පාට පැන්සල් සහ මාර්කර්) ඇත. ඔබ නිදහසේ ඔබට අවශ්‍ය දේවල් පාවිච්චි කරන්න. ඔබ ඇඳීම ආරම්භ කිරීමට පෙර සම්පූර්ණ පින්තූරයක් බලා සිටීමට අවශ්‍ය නොවේ. මංද යත් බොහෝ විට, ඔබ ඇඳීම ආරම්භ කිරීමෙන් පසුව, සම්පූර්ණ පිංතූරය, ඔබට එළිදරව් වනු ඇත.

(කරුණාකර භාවිතා කිරීමෙන් පසු මාර්කර් / වර්ණ පැන්සල් ආපසු ලබා දෙන්න.)